# රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩල නිල නිවසක පුරප්පාඩුව

## ගෘහ පාලක/රෙදි පවිත්‍ර කරන්නා (කාන්තා/පිරිමි)

මෙම තනතුර දරන්නා සේව්‍යයාට සහ නිවසේ අවශ්‍යතාවයන්ට සරිලන පරිදි ඉහළ වෘත්තිමයභාවයකින් මෙන්ම මනා සංවිධානයකින් යුතුව සේවය සැපයිය යුතු අතර විශිෂ්ටත්වයේ ප්‍රමිතීන්ට අනුකූලව සියලුම සාමාන්‍ය ගෘහ පාලන සහ රෙදි පවිත්‍ර කිරීමේ කටයුතු සිදුකළ යුතු ය. එසේම සේව්‍යයාගේ හෝ සේව්‍යයා විසින් පත් කරන ලද වරලත් නියෝජිතයාගේ අධීක්ෂණය යටතේ අනෙකුත් ගෘහයේ අවශ්‍යතාවන් සඳහා අවශ්‍ය පරිදි දායකත්වය දිය යුතු ය.

**මෙම තනතුර සඳහා සේවා කාල සටහන සතියට පැය 50 කි.**

**මෙම තනතුර සඳහා මාසික වැටුප ඇමෙරිකානු ඩොලර් 361.25 කි.**

කාර්යමණ්ඩල වේතන ඇමෙරිකානු ඩොලර් මඟින් නම් කර ඇති අතර ගෙවීම් කාල සීමාවේ පවතින විනිමය අනුපාතයන්ට අනුව රුපියල් වලින් ගෙවීම සිදු කෙරේ. 2024 අගෝස්තු 20 වනදා වන විට විනිමය අනුපාතය ඇ. ඩො. 1 = රු. 299.40 කි. මෙය තානාපති කාර්යාලයේ දේශීය ප්‍රතිපූරණ සැලැස්මේ තාවකාලික සංශෝධනයක් වන අතර අනිවාර්ය අයිතියක් නොවේ.

**<u>සම්පූර්ණ කළ යුතු සුදුසුකම්:</u>**

- අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිටීම හෝ උත්සාහ කර තිබීම අවශ්‍ය වේ.
- සමාන තනතුරක අවම වශයෙන් වසර දෙකක රැකියා පළපුරුද්ද (සත්කාරක ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂයි).
- කුඩා දේවල් පිළිබඳව පවා මනා අවධානයක් යොමු කිරීම, බහුකාර්යය කුසලතාව, කාර්යයන් නිසි ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය පරිදි නම්‍යශීලී වීම සහ අනුගත වීම.
- සෑම විටම වෘත්තීය අවංකභාවය, සාරධර්ම සහ සදාචාරත්මක ප්‍රතිපත්ති පවත්වාගෙන යාම.
- රෙදි පවිත්‍රකාරක, පිරිසිදු කිරීමේ සහ රෙදි පවිත්‍ර කිරීමේ උපකරණ භාවිතය පිළිබඳ පුළුල් අත්දැකීම.
- සුරතල් සතුන් (බල්ලන්, පූසන් වැනි) සමඟ අපහසුවකින් තොරව කටයුතු කිරීමට හැකි වීම.
- ඉංග්‍රීසි භාෂාව මෙන්ම සිංහල සහ/හෝ දමිළ භාෂාව චතුර ලෙස හැසිරවීමේ හැකියාව.

**(නිල නිවාස කාර්ය මණ්ඩලය ලෙස සේවය කරන ගෘහ සේවකයින් තානාපති කාර්යාලයේ සේවකයින් ලෙස නොසලකන අතර ඔවුන් සේවය කරන නිවස අයිති පුද්ගලයාගේ සේවකයින් බව කරුණාවෙන් සලකන්න.)**

මේ සඳහා උනන්දුවක් දක්වන පුද්ගලයන් පහත අනිවාර්යය විස්තර සහිතව සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රයක් විද්‍යුත් තැපෑලෙන් යොමුකළ යුතු ය.

1. සම්පූර්ණ නම
2. වර්තමාන ලිපිනය සහ දුරකතන අංකය
3. ඔබ වයස අවුරුදු 18ත් - 60ත් අතර ද? (ඔව්/නෑ)
4. ඔබ අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා පෙනී සිට තිබේ ද? එසේ නම් විස්තර සපයන්න.
5. සමාන තනතුරක අවම වශයෙන් වසර දෙකක රැකියා පළපුරුද්ද තිබේ ද? එසේ නම් සේවා ස්ථානයේ නම, සේවා කාලය, රාජකාරීන් සහ වගකීම් පිළිබඳව විස්තර සපයන්න.
6. ඔබේ වර්තමාන/පසුගිය මාසයේ සම්පූර්ණ වේතනය

මේ සඳහා උනන්දුවක් දක්වන අපේක්ෂකයින් ඔවුන්ගේ අයදුම්පත්, මෑතකදී සකස් කරන ලද ජීව දත්ත පත්‍රයක් සමඟ **"ColomboERA@state.gov"** වෙත විද්‍යුත් තැපෑලෙන් එවිය යුතු ය. විද්‍යුත් තැපෑලේ විෂයය ලෙස **"ගෘහ පාලක / රෙදි පවිත්‍ර කරන්නා"** යනුවෙන් සඳහන් කළ යුතු ය.

ඔබගේ අයදුම්පත් 2024 **ඔක්තෝබර්** 13 හෝ ඊට පෙර අප වෙත ළඟා විය යුතු ය.

**කෙටි ලැයිස්තුගත අපේක්ෂකයින් පමණක් සම්බන්ධ කර ගන්නා බව කරුණාවෙන් සලකන්න.**